# කොරවක් අම්මාගේ ආදරේ



දෙවන දිග හැරීම

තවිතිසා දිව්‍යාංජලි

# කෘතියේ නම
## කොරවක් අම්මාගේ ආදරේ

# කෘතිගේ නම
## W.P.D තවිතිසා දිව්‍යාංජලී

# කෘතිගේ වෙනත් කෘති
## අපේ ගෙදරට ආ කුරුළු පැංචෝ

පාසල - මහ/මහාමායා බාලිකා විද්‍යාලය

ඉගෙනුම ලබන පන්තිය - 4-D

කෘතිය පල කරන දිනය - 2026/05/10

# ලෙන්ගතුව සිහි කරමි

දරා දස මසක් කුස තුළ

ලේ බිඳු කිරට හරවා

සෙනෙහසින් මා නළවා

මා අතනොහැර හැම විටක

දරා සිටින මාගේ රත්තරන් අම්මාටත්

දහදිය කඳුළු මුතු කොට

මාව පෝෂණය කරන

රත්තරන් අප්පච්චීට

පුංචි මා වටා පුවුරු වළල්ලක් සේ

නිබඳවම රකින සෙනෙහස දෙන

අත්තම්මා ලොකු අත්තම්මා,අයියා,අක්කා

මහාමායාවට මා පැමිණි දා පටන්

යහගුණ දම් ගුරුහරුකම් ලබාදෙමින්

මාගේ පුංචි දිවිය එකළු කරමින්

ජීවිතය සැරසූ

ගයත්‍රි සෙනෙවිරත්න , ගුරු මෑණියන්ටත්

නිරංජලා වීරසිංහ , ගුරු මෑණියන්ටත්

# පුදමී බැතියෙන්

සසුනුඹර එකළු කරමින්

පතාක යෝධයෙකු මෙන්

නිවන් මඟ නිබඳ වඩිනා

පුංචි සිත් දහම් මඟට යොමු කරමින්

ලක් බිම පුරා දම් ගුණ සුවඳ පතුරවමින්

අති පූජ්‍ය ගරුතර අමරපුර චූලගන්ධි

මහා නිකායේ මහානායක ගංතුණේ අස්සජී හිමිපානන්

වහන්සේටත් ....

අරන්දර දම්සෙත ශ්‍රී බෝධිරාජාරාම විහාරස්ථානයේ

විහාරාධිපති , අරන්දර විද්‍යාලයේ නියෝජ්‍ය

විදුහල්පති,

අමරපුර චූලගන්ධි පාර්ශ්වයේ සබරගමු පළාත් ද්විතීය

සංඝනායක අස්මදාචාර්ය ගරුතර අරන්දර විජිත

නන්ද නාහිමියන් වහන්සේට.... මාගේ ජීවිතයේ

සොඳුරු තෝතැන්න වූ මහාමායවේ විදුහල්පතිනිය

ශශිකලා , සේනාධීර මැතිණියටත් ප්‍රාථමික අංශයේ

විදුහල්පතිනියටත්



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.


ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.


සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලූ  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමගින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10



මා ගෙදර සිටින සෑම නිවාඩු දවසකම පරිසරයේ සුන්දරත්වය විඳින්නට පුරුදු වී සිටින්නෙමි. මාගේ නිවස පිටුපසින් ගලා යන්නේ සොඳුරු ඇළ පහරකි. දවසක් මා හිමින් හිමින් ඇළ පහර දෙසට පිය මැන්නාය. මාගේ පුංචි සවනට ඇසුනේ කොරවක්කෙකුගේ නාදයයි. මා සෙමින් විපරම් කර බැලුවාය. මාගේ නෙත ගැටුනේ කොරවක් අම්මෙක් සහ පැටවු තිදෙනෙකි. එයාලා කෙටල ගාලේ සිට ඇළ පහර දෙසට පිනා ගියේය.



කොරවක් අම්මා සහ පැටවු හරි සතුටින් එහා මෙහා කෑ ගසමින් පිහිනුවේ ය. එකවර ම අහස කළු වුනි. හෙන හඬ පපුරා මහා වර්ෂාවක් ටිකෙන් ටික ඇද හැලෙන්නට විය. කෙමෙන් කෙමෙන් වතුරේ සැඩ පහර ද වේගවත් විය. ම දුටුවේ ඉතා දුක්බර දසුනකි. සැඩ පහරට අසු වී ගසා යන කොරවක් පැටවු දෙදෙනෙකි. කොරවක් මව මහ හඬින් විලාප දෙමින් පැටවුන් හොටෙන් තල්ලු කරගෙන ඇළ ඉවුරට පැමිණියේය.



සීතලෙන් ගැසමෙන් සිටි පැටවුන් දෙදෙනා වේගයෙන් මවගේ තුරුළට පැමිණියා ය. මව කෑ ගසමින් පැටවු දෙදෙනා උණුසුම් කළාය. සතෙකු වුවත් කොරවක් අම්මාගේ දරුවන් කෙරෙහි ඇති අපිරිමිත සෙනෙහේ කොතරම් ද? පුංචි අපත් අම්මාගේ ආදරය හොඳින් තේරුම් ගෙන ලොවක් සුවඳ කරමු.





# පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.
මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.



ISBN 9786242114002